## සමුපකාර තොග වෙළඳ සංස්ථාව - 2017

---

සමුපකාර තොග වෙළඳ සංස්ථාවේ 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂයේ මෙහෙයුම් කටයුතු පිළිබඳව 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තිය සහ 1969 අංක 12 දරන සමුපකාර තොග වෙළඳ සංස්ථා (සංශෝධන) පනතේ 6 වන වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මුදල් පනතේ 13 (6) වගන්තිය ප්‍රකාරව ඉදිරිපත් කළ යුතු 2017 වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2019 සැප්තැම්බර් 20 දින වන විටත් ඉදිරිපත් කර නොතිබුණි. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව ප්‍රකාරව මා විසින් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළ යුතු යැයි අදහස් කරන සමාලෝචිත වර්ෂයේ සංස්ථාවේ ක්‍රියාකාරිත්වය සම්බන්ධයෙන් වූ මාගේ නිරීක්ෂණ මෙම වාර්තාවේ ඇතුළත් වේ.

### 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

---

මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

### 2. මූල්‍ය ප්‍රකාශන

---

### 2.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

---

2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 6.5.1 වගන්තිය ප්‍රකාරව ගිණුම් වර්ෂය අවසන් වී දින 60 ක් තුළ සංස්ථාවේ මූල්‍ය ප්‍රකාශන හා කෙටුම්පත් වාර්ෂික වාර්තාව විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවත් 2017 වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2019 සැප්තැම්බර් 20 දින වන විටත් විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

### 2.2 වත්කම් හා වගකීම්වල පැවැත්ම

---

සංස්ථාව විසින් අවසන් වරට පිළියෙල කරන ලද 2016 දෙසැම්බර් 31 දිනට වූ මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන වත්කම්, බැරකම්, ආදායම් හා වියදම් පිළිබඳ විස්තර පහත දැක්වේ.

| විස්තරය | 2016 |
|---|---|
| | රු. |
| <u>වත්කම්</u> | |
| ජංගම නොවන වත්කම් | 6,854,600,350 |
| ජංගම වත්කම් | 861,720,868 |
| එකතුව | 7,716,321,218 |
| <u>ස්කන්ධය හා වගකීම්</u> | |
| ස්කන්ධය | 1,388, 648,519 |
| ජංගම නොවන වගකීම් | 4,801,949,399 |
| ජංගම වගකීම් | 1,525,723,300 |
| එකතුව | 7,716,321,218 |

| | |
|---|---|
| මුළු ආදායම | 2,635,144,827 |
| මුළු වියදම | 3,138,593,202 |
| | ----------------- |
| ඌනතාවය | 503,448,375 |
| | ========== |

## 2.3 සංස්ථාවේ අඛණ්ඩ පැවැත්ම

සංස්ථාව 2000 වර්ෂයේ සිට 2013 වර්ෂය දක්වාම අඛණ්ඩව අලාභ ලැබීම හේතුවෙන් 2013 වර්ෂය අවසානයට රු.7,710,099,424 ක ඍණ අගයක් දක්වා ශුද්ධ වත්කම් හීනවී පැවතුණි. 2014 වර්ෂයේ සිදුකළ වත්කම් ප්‍රත්‍යාගණනය හේතුවෙන් ජනිතවූ රු.5,780,204,145 ක් වූ අතිරික්තය හේතුවෙන් ශුද්ධ වත්කම්හි ඍණ අගය 2015 වර්ෂයේදී රු.2,764,039,908 දක්වා අඩු විය. සංස්ථාවේ වගකීම් ලෙස මහා භාණ්ඩාගාරය විසින් නිකුත් කර තිබූ රු.4,397,000,000ක් වටිනා භාණ්ඩාගාර බැඳුම්කර මහා භාණ්ඩාගාරය විසින් නිරවුල් කර 2016 වර්ෂයේදී ස්කන්ධ ප්‍රාග්ධනය බවට පරිවර්තනය කිරීම හේතුවෙන් සංස්ථාවේ ශුද්ධ වත්කම් රු.1,388,648,519 ක අගයක් ගෙන තිබුණි.

## 2.4 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2017 සහ 2018 වර්ෂයන්හිදී සංස්ථාව විසින් රාමසාන් උත්සවය සඳහා අවශ්‍ය රටඉඳි තොගයන් මුස්ලිම් ආගමික හා සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව වෙනුවෙන් මිලදී ගෙන තිබුණු අතර ඒ වෙනුවෙන් සංස්ථාව වෙත ප්‍රවාහන ගාස්තු වෙනුවෙන් අයවිය යුතු වටිනාකම වූ රු.1,413,417 ක් හා වරායෙන් භාණ්ඩ නිදහස් කිරීමේ ගාස්තු වෙනුවෙන් ලැබිය යුතු රු.599,526 ක් 2018 සැප්තැම්බර් 14 දින වන විටත් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ආ) 2016 වර්ෂයේදී ආරම්භ කරන ලද මිල්කෝ නිෂ්පාදන බෙදාහැරීමේ නියෝජ්‍යත්ව ව්‍යාපෘතියේ මෙහෙයුම් කටයුතු 2018 වර්ෂයේ පෙබරවාරි වන විට සම්පූර්ණයෙන්ම නවතා දමා තිබුණු අතර 2018 ජූලි 31 දින වන විට නිෂ්පාදන අලෙවි කිරීම තුළින් සංස්ථාව වෙත රු.94,163,920 ක මුදලක් රාජ්‍ය හා පෞද්ගලික ආයතනවලින් අයවිය යුතුව පැවතුණි.

(ඇ) 2017 වර්ෂය තුළ ලංකා සතොස සමාගම වෙත ප්‍රවාහන සේවා සැපයීම වෙනුවෙන් 2018 සැප්තැම්බර් 14 දිනට රු. 117,688,923 ක් හා 2016 වර්ෂය වෙනුවෙන් රු.8,833,158 ක් අයවිය යුතුව පැවතුණි.

(ඈ) පාරිභෝගික සේවා අධිකාරියට 2011 වර්ෂයේ දී කෙටිකාලීන ණය පදනම මත ලබා දෙන ලද රු.1,000,000 ක ණය මුදල හා ඊට අදාල පොළිය ආපසු අයකර ගැනීමට 2018 සැප්තැම්බර් 14 දින වන විටත් කටයුතු කර නොතිබුණි.

(ඉ) ජීවන වියදම් අනු කමිටු තීරණයකට අනුව සංස්ථාව විසින් 2017 අගෝස්තු 25 දින සිට 2018 අප්‍රේල් 18 දින දක්වා වූ කාල පරිච්ඡේදය තුල ඉන්දියාවෙන් සහල් මෙට්‍රික් ටොන් 110,966 ක් ආනයනය කර පිරිවැයට වඩා අඩු මිලකට අලෙවි කිරීමට සිදුවූ අතර එම පාඩුව මහා භාණ්ඩාගාරය විසින් ආවරණය කල යුතු විය. සහල් ආනයනය කිරීම වෙනුවෙන් සංස්ථාව විසින් රාජ්‍ය බැංකුවකින් රු.7,525,575,423 ක් වූ ණය මුදලක් ලබාගෙන තිබුණි. 2018

සැප්තැම්බර් 10 දින වන විට තවදුරටත් ගෙවිය යුතු ණය මුදලේ ප්‍රමාණය රු.6,307,788,128 ක් වූ අතර අඩු මිලට සහල් විකිණීමේ අලාභය සඳහා රු.1,854,265,072 ක් භාණ්ඩාගාරයෙන් ලැබිය යුතුව තිබුණි.

**2.5 නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම**

1991 අංක 31 දරන සමූපකාර තොග වෙළඳ සංස්ථා (සංශෝධන) පනතේ 2.2 (අ) වගන්තිය ප්‍රකාරව සංස්ථාවේ මුදල් ආයෝජනය කළ හැක්කේ පවත්නා පොදු සමාගම්වල පමණක් වුවද ඊට පටහැනිව රු.10 ක කොටසක නාමික ආයෝජනයක් සිදුකර "සී/ස සතොස ආර්ථික මධ්‍යස්ථාන සේවා පෞද්ගලික සමාගම" හා "සී/ස සතොස ඉදිකිරීම් හා ඉංජිනේරු පෞද්ගලික සමාගම"නමින් රාජ්‍ය සමාගම් 02 ක් ස්ථාපිත කර තිබුණි.

**2.6 සංස්ථාවට එරෙහිව හෝ සංස්ථාව විසින් ආරම්භ කර ඇති නෛතික සිද්ධි**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ආයතන 04 ක් හා පුද්ගලයින් 32 දෙනෙකු විසින් සමාලෝචිත වර්ෂය අවසන් වන විට සංස්ථාවට එරෙහිව රු.86,397,096 ක වන්දි ඉල්ලා නඩු 37 ක් පවරා තිබුණු අතර සංස්ථාව විසින් සමාලෝචිත වර්ෂය තුල නඩු 11 කට අදාලව රු.5,590,457 ක වන්දි මුදලක් ගෙවා තිබුණි.

(ආ) සංස්ථාව විසින් ආයතන 07 කට හා පුද්ගලයින් 04 දෙනෙකුට එරෙහිව රු.101,695,558 ක මුදලක් ඉල්ලා නඩු 11 ක් පවරා ඇති අතර එමඟින් රු. 2,735,000 ක මුදලක් අයකර ගෙන තිබුණි.

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 කාර්යසාධනය**

**3.1.1 සැලසුම් කිරීම**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2014 පෙබරවාරි 17 දිනැති අංක 01/2014 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව සංස්ථාවේ දැක්ම හා මෙහෙවර ඉටුකර ගැනීම සඳහා 2017 වර්ෂයේ සිට 2020 වර්ෂය දක්වා ආවරණය වන පරිදි සංයුක්ත සැලැස්මක් සකස් කර තිබුණද එය කාලානුරූපීව සමාලෝචනය කර නොතිබුණි.

(ආ) 2014 පෙබරවාරි 17 දිනැති අංක 01/2014 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව සමාලෝචිත වර්ෂයට අදාලව ක්‍රියාකාරී සැලැස්ම පිළියෙල කර තිබුණද එහි මානව සම්පත් සංවර්ධන සැලැස්ම, ණය ආපසු ගෙවීමේ සැලැස්ම හා අභ්‍යන්තර විගණන සැලැස්ම ඇතුළත් කර නොතිබුණි.

**3.1.2 ක්‍රියාකාරිත්වය හා සමාලෝචනය**

-------------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සංස්ථාවේ 2017 වර්ෂයේ කාර්යසාධන වාර්තාවේ දැක්වෙන පරිදි " නවතාවයකින් යුතු භාණ්ඩ උත්පාදනය/ ප්‍රභවය සඳහා පර්යේෂණ හා සංවර්ධන කටයුතු සිදු කිරීම " යන අරමුණ ඉටුකර ගැනීම කෙරෙහි 2017 වර්ෂයේදී අවධානය යොමු කර නොතිබුණි.

(ආ) සංස්ථාව සමාලෝචිත වර්ෂය තුල ආරම්භ කර ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර තිබූ කාර්යයන්හි ප්‍රගතිය සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(i) වෙළඳපල තුළ තෝරාගත් පාරිභෝගික භාණ්ඩවල මිල උච්චාවචනය අඩුකිරීම හා ස්ථාවර මිලක් ඇති කිරීම සඳහා රු. 1,000,000,000 ක් වටිනා භාණ්ඩ දේශීය වෙළඳපලෙන් මිලදී ගැනීමට සැලසුම් කර තිබුණද එය ක්‍රියාත්මක කර නොතිබුණි.

(ii) සංස්ථාවේ සේවකයින්ගේ ඵලදායීතාවය හා රැකියා ජීවිතයේ ගුණාත්මකභාවය වැඩි දියුණු කිරීම සඳහා සමාලෝචිත වර්ෂයේදී රු.300,000 ක ප්‍රතිපාදන වෙන්කර තිබූ නමුත් රු. 70,690 ක් එනම් සියයට 24 ක් පමණක් වැයකර තිබුණි.

(iii) සමාලෝචිත වර්ෂය තුල ජංගම අලෙවිසැල් 10 ක් ඇති කිරීමට සැලසුම් කර තිබුණද ජංගම අලෙවිසැල් කිසිවක් ආරම්භ කර නොතිබුණි.

(iv) සංස්ථාවේ ප්‍රවාහන ආදායම වැඩිකිරීම සඳහා රජයේ ආයතන/සංවිධාන සමඟ එකඟතාවයන් ඇති කර ගැනීමට හා ප්‍රවාහන ආදායම වැඩිකර ගැනීම සඳහා කල්බදු ක්‍රමයට නව වාහන 05 ක් වාහන සංචිතයට එකතු කිරීමට සැලසුම් කර තිබුණද එම කාර්යයන් සමාලෝචිත වර්ෂය තුල ඉටුකර නොතිබුණි.

(v) සංස්ථාවේ සහල් සැකසුම් ක්‍රියාවලියෙහි ඵලදායීතාවය සහ කාර්යක්ෂමතාවය වැඩිදියුණු කිරීම සඳහා පන්නෙගමුව හා හිඟුරක්ගොඩ සහල් මෝල් 02 හි ධාරිතාවය උපරිම වශයෙන් මෙට්‍රික් ටොන් 20,000 ක් දක්වා භාවිතා කිරීමට සැලසුම් කර තිබුණද භාවිතා කරන ලද ධාරිතාවය මෙට්‍රික් ටොන් 1.3 ක් හෙවත් මුළු ධාරිතාවයෙන් සියයට 07 ක් පමණක් විය.

(vi) සංස්ථාව හා ප්‍රධාන ආයෝජකයන් අතර නව ව්‍යාපාර කටයුතු සම්බන්ධයෙන් බද්ධ ව්‍යාපාර කටයුතු සඳහා නව ව්‍යාපාර අවස්ථා ඇතිකර ගැනීමට හෝ නව නිෂ්පාදන හා සේවා හඳුන්වාදීම හෝ සිදු කිරීමට සැලසුම් කර තිබුණද සමාලෝචිත වර්ෂය තුල එම අරමුණු ඉටුකර ගැනීමට නොහැකිව තිබුණි.

(vii) සංස්ථාවේ වෙළඳ ධාරිතාවය ව්‍යාප්ත කිරීම සඳහා සමාලෝචිත වර්ෂය තුළ බාහිර පාර්ශවයන් වෙත රු. 800,000,000 ක් වූ අත්‍යාවශ්‍ය භාණ්ඩ සැපයීමට සැලසුම් කලද සපයන ලද භාණ්ඩ වටිනාකම රු.242,000,000 ක් පමණක් විය. එය අපේක්ෂිත වටිනාකමින් සියයට 30 ක් පමණක් විය.

තවද සංස්ථාවේ වෙළඳ ධාරිතාවය ව්‍යාප්ත කිරීම සඳහා වර්ෂය තුළ නිදහස් වෙළඳ ගිවිසුම යටතේ භාණ්ඩ මෙට්‍රික් ටොන් 7,000 ක් ආනයනය කිරීමට සැලසුම් කලද සංස්ථාව විසින් ආනයනය කළ භාණ්ඩ ප්‍රමාණය මෙට්‍රික් ටොන් 3,850 ක් හෙවත් අපේක්ෂිත වටිනාකමෙන් සියයට 55 ක් විය.

(viii) සමාලෝචිත වර්ෂය තුල සංස්ථාව විසින් බෙදාහැරීමේ නියෝජකත්ව (Outlet) 200 ක් ඇති කිරීමට අපේක්ෂා කළද කිසිදු නියෝජිත ආයතනයක් ඇතිකර ගැනීමට නොහැකිව තිබුණි.

(ix) වර්ෂය තුළ බාස්මතී සහල් අලෙවියෙන් අපේක්ෂිත ආදායම රු.940,000,000 ක්ද ඉස්සන් අලෙවියෙන් අපේක්ෂිත ආදායම රු.548,000,000 ක්ද රතු පරිප්පු අලෙවියෙන් අපේක්ෂිත ආදායම රු.118,000,000 ක් වු අතර සත්‍ය ආදායම පිළිවෙලින් රු.135,500,000, රු.73,700,000 ක් සහ රු. 87,100,000 ක් පමණක් විය.

(x) 2017 වර්ෂය තුළ සංස්ථාව සතු ගොඩනැගිලි කුලියට දීමෙන් අපේක්ෂිත ආදායම රු.248,000,000 ක් වු අතර ගිණුම් තුල දැක්වෙන ආදායම රු. 225,700,000 ක් විය. තවද වර්ෂය තුල සංස්ථාව සතු වර්ග අඩි 16,000 ක ප්‍රමාණයක ගොඩනැගිලි අළුත්වැඩියාවන් සිදු කිරීමට සැලසුම් කලද වර්ෂය තුල ගොඩනැගිලි අළුත්වැඩියාවන් සිදු කර නොතිබුණි.

## 3.2 කළමනාකරණ ක්‍රියාකාරකම්

-----------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සංස්ථාව විසින් තක්සේරු වටිනාකම රු.54,722,228 ක් වූ වත්කම් සී/ස ලංකා සතොස සමාගමට පවරා දී තිබුණු අතර, ඒ වෙනුවට මුදල් ලබා ගැනීමට හෝ සමාගමේ කොටස් ලබා ගැනීමට හෝ විධිමත් එකඟතාවයකට 2018 සැප්තැම්බර් 20 දින වන විටත් එළඹ නොතිබුණි.

(ආ) සංස්ථාව විසින් 1999 වර්ෂයේදී පෞද්ගලික සමාගමක රු.9,923,710 ක් ආයෝජනය කර තිබුණද එම සමාගම දිගින් දිගටම පාඩු ලැබීම මත 1999 වර්ෂයේ සිට 2017 වර්ෂය දක්වා කිසිදු ලාභාංශ මුදලක් ලැබී නොතිබුණි.

(ඇ) වෙළඳ ද්‍රව්‍ය මිලදී ගැනීම සඳහා 2006 වර්ෂයේදී මහා භාණ්ඩාගාරය විසින් ලබාදී තිබුණු රු.275,000,000 ක ණය මුදල ආපසු ගෙවීමට 2017 වර්ෂයේදී ද කටයුතු කර නොතිබුණි.

(ඈ) පසුගිය වර්ෂ 5ක ඇසුරුම් අංශයේ ආදායමෙන් සියයට 95 කට වඩා වැඩි ප්‍රතිශතයක් ලංකා සතොස ආයතනයෙන් ලැබී තිබුණද ඒ සම්බන්ධව දෙපාර්ශවය අතර ගිවිසුමකට එළඹ නොතිබුණි. තවද එසේ එක් ආයතනයක් මත පමණක් සංස්ථාවේ ඇසුරුම් අංශය රැඳී පැවතිම අවධානම් සහිත බැවින් විකල්ප අවස්ථා ඇතිකර ගැනීම කෙරෙහි කළමනාකරණයේ අවධානය යොමු කර නොතිබුණි.

(ඉ) වර්තමානයේ පවතින වෙළඳපල අගයට වඩා අඩු අගයකට සංස්ථාව සතු ගොඩනැගිලි 36 ක් බදු දීම නිසා මාසයකට රු.4,667,300 ක් බැගින් රු.56,007,600 ක ආදායමක් වාර්ෂිකව අහිමි වී තිබුණු අතර ගොඩනැගිලි 03 ක් සඳහා 2017 වර්ෂයේ කිසිදු වාරිකයක් අයකර ගැනීමට කළමනාකරණය අපොහොසත් වීමෙන් මාසිකව රු.448,830 බැගින් වර්ෂයකට රු.5,385,960 ක බදු ආදායමක් සංස්ථාවට අහිමි වී තිබුණි.

(ඊ) සංස්ථාව විසින් සංස්ථාව සතු දේපල කොටස් 39 ක් විධිමත් බදු ගිවිසුමකට එළඹීමෙන් තොරව මාසිකව රු.6,227,414 ක්වූ බදු වටිනාකමකට රාජ්‍ය හා පෞද්ගලික ආයතන 14 කට බදු පදනම මත ලබාදී තිබුණි.

(උ) 2014 දෙසැම්බර් ආරම්භ කරන ලද " ගමට සවිය සතොස බඩිය " ව්‍යාපෘතිය යටතේ සංස්ථාව විසින් මූල්‍ය කල්බදු පදනම මත මිලදී ගෙන අලෙවි සහකරුවන් අතර බෙදා දී තිබුණ රු.1,456,368 ක් වටිනාකම වූ ලොරි රථයක් ව්‍යාපෘති කටයුතු නවතා දමා වසර 02 ට වැඩි කලක් ගත වුවද මේ දක්වා ලොරි රථය සංස්ථාව වෙත පවරාගෙන නොතිබුණි.

(ඌ) සමුපකාර තොග වෙළඳ සංස්ථාව විසින් ලංකා සතොස සමාගම වෙත නිකුත් කරනු ලබන ඉන්වොයිස්පතෙහි සඳහන් වටිනාකමට වඩා අඩු වටිනාකමක් ලංකා සතොස සමාගම විසින් ගෙවන අතර නියැදි පරික්ෂණ අවස්ථා 16 කදී එසේ අඩුවෙන් ලද මුදල රු.742,438 ක් විය.මේ සඳහා හේතු විමසා ලංකා සතොස සමාගමෙන් හිඟ මුදල් අයකර ගැනිමට කටයුතු කර නොතිබුණි. තවද මේ හේතුවෙන් එකතු කල අගය සඳහා බදු ගණනය කිරීමේදී ඉන්වොයිස් අගයන් පදනම් කර ගැනීමට සිදුවීම නිසා එම සංස්ථාව වෙත නොලැබුණ මුදලක් සඳහා එකතු කල අගය මත බදු ගෙවීමට සිදුවී තිබුණි.

(එ) මිල්කෝ ව්‍යාපෘතිය 2018 ජනවාරි 31 දිනෙන් අවසන් කර තිබුණද කළමනාකරණය විසින් අදාල ලොරි රථ හිමියන්ට ඒ බව කලින් දන්වා නොතිබීම හේතුවෙන් ගිවිසුම් ප්‍රකාරව ශිතාගාර පහසුකම් සහිත ලොරි රථ 3 ක් සඳහා සේවා ලබා නොගෙන පෙබරවාරි කුලිය වශයෙන් රු. 416,000 ක් ගෙවීමට සිදුව තිබුණි.

තවද 2017 දෙසැම්බර් ගිවිසුම් කාලය අවසන් වූ ලොරි රථයක් සඳහා 2018 ජනවාරි මාසය සඳහා රු.112,000 ක් ගෙවා තිබුණු අතර 2017 වර්ෂයේ මාස දෙකක් තුලදී අදාල ධාවන කටයුතු සඳහා යෙදවීමකින් තොරව හා ශිතාගාර පහසුකම් සහිතව නොතිබියදී රු.224,000 ක් ද ගෙවා තිබුණි.

(ඒ) සංස්ථාව විසින් 2017 වර්ෂය තුල ක්‍රියාත්මක කළ ප්‍රධාන ව්‍යාපෘති 4 කට අදාල ආදායම, වියදම, ලාභ/අලාභ සහ ඉතිරි තොග හඳුනා ගැනීමට 2018 ඔක්තෝබර් 04 දින වන විටත් කටයුතු කර නොතිබුණි.

## 3.3 කාර්ය මණ්ඩල පරිපාලනය

------------------------------

සංස්ථාවේ අනුමත කාර්ය මණ්ඩලය කළමණාකරණ ශ්‍රේණියේ තනතුරු 25 කින්ද, කළමනාකරණ සහකාර මට්ටමේ තනතුරු 51 කින්ද, ප්‍රාථමික ශ්‍රේණියේ තනතුරු 248 ක්ද වශයෙන් මුළු තනතුරු 324 කින් සමන්විත වූ අතර 2018 ජූලි 31 වන විට අතිරික්ත සේවක සංඛ්‍යාව 220 ක් හා පුරප්පාඩු සංඛ්‍යාව 34 ක් විය.

## 4. තිරසාර සංවර්ධනය

----------------------

## 4.1 තිරසාර සංවර්ධන අරමුණු ලඟාකර ගැනීම

--------------------------------------------------

තිරසාර සංවර්ධනය පිළිබඳ එක්සත් ජාතීන්ගේ වසර 2030 න්‍යාය පත්‍රය ප්‍රකාරව සෑම රාජ්‍ය ආයතනයක් විසින්ම කටයුතු කළ යුතුව පවතින අතර, සමාලෝචිත වර්ෂයට අදාළව සමුපකාර තොග වෙළඳ සංස්ථාව විසින් තම විෂය පථය යටතට ගැනෙන කාර්යයන් සම්බන්ධයෙන් කෙසේ ක්‍රියාත්මක විය යුතුද යන්න පිළිබඳව දැනුවත් වී අරමුණු කරා ළඟාවීමට අවශ්‍ය ඉලක්ක හා ඊට අදාල දර්ශක කිහිපයක් දළ වශයෙන් හඳුනාගෙන තිබුණද ඊට අදාල ප්‍රතිපාදන වෙන්කර ක්‍රියාකාරී සැලැස්මේ ඇතුළත් කර ඒවා ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය මානව හා භෞතික සම්පත් හඳුනාගෙන නොතිබුණි.

## 5. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය

### 5.1 නොවිසිඳී ඇති විගණන ඡේද

නොවිසිඳී ඇති විගණන ඡේද පහත දැක්වේ.

| | විගණන වාර්තාවේ යොමුව | ඡේදය |
|---|---|---|
| (අ) | 2011- 4.2 ඡේදය | වටිනාකම රු.5,097,445 ක් වූ "බහළුම් යන්ත්‍ර" 12 හි විදුලි මෝටර් අස්ථාන ගතවීම. |
| (ආ) | 2011- 4.8 ඡේදය | 2006 සැප්තැම්බර් මාසයේදී සංස්ථාව විසින් ආනයනය කරන ලද රු.14,501,998 ක් වූ සහල් සැකසීම් යන්ත්‍ර 140 ක් 2016 සැප්තැම්බර් 13 වන විටත් සංස්ථාව තුල නිෂ්ක්‍රීයව පැවතීම. |
| (ඇ) | 2012 -2.2.3(ඉ) | 2011වර්ෂය වෙනුවෙන් වාර්ෂික බදු කුලී හා රටබීම බලපත්‍ර ගාස්තු වශයෙන් ලංකා සතොස සමාගමෙන් ලැබිය යුතු රු.71,561,640 ක් සමාලෝචිත වර්ෂය අවසානය වන විටත් අයකර ගැනීමට කටයුතු කර නොතිබීම. |
| (ඈ) | 2012 - 4.3 (ආ) | කුලී පදනම මත ලබාගත් ආහාර කොමසාරිස් දෙපාර්තමේන්තුවට අයත් ගබඩා 02ක ආහාර කොමසාරිස් දෙපාර්තමේන්තුවේ අනුමැතියකින් තොරව රු.78,978,504 ක වියදමක් වැය කර සංස්ථාව විසින් වී මෝල් ඉදිකර තිබීම. |
| (ඉ) | 2012 - 2.2.3(ඇ) | වාහන විකුණුම් ලාභය රු.5,101,356 ක් වුවද එය මූල්‍ය ප්‍රකාශනවල රු.5,892,489 ක් ලෙස දක්වා තිබීම නිසා වාහන විකුණුම් ලාභය රු.791,133 ක් වැඩියෙන් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබීම. |
| (ඊ) | 2012 - 2.2.4(අ) | 2012 වර්ෂයේ ශේෂ පිරික්සුම පරීක්ෂා කිරීමේදී වත්කම් හා වියදම් ගිණුම් 168 ක එකතුව රු.27,584,061,602 ක් වූ හර ශේෂයන්ද වගකීම් හා ආදායම් ගිණුම් 110 ක එකතුව රු.30,129,471,178 ක් වූ බැර ශේෂයන් ද මූල්‍ය ප්‍රකාශන සමග එකඟ නොවීම. |
| (උ) | 2012 - 2.2.4(ආ) | ශේෂ පත්‍රයේ ජංගම වගකීම් යටතේ ටීආර් ණය මහජන බැංකුව නමින් රු.207,050,943 ක කෙටිකාලීන ණයක් දක්වා තිබූ නමුත් බැංකුව විසින් එවන ලද ශේෂ තහවුරු කිරීමේ ලිපිය පරිදි එම ණය ශේෂය රු.207,097,942 ක් වීම. |

| | | |
|---|---|---|
| (ඌ) | 2012 - 2.2.5(අ) | 2012 දෙසැම්බර් 31 දින දක්වා ඇසුරුම් අංශය වෙත ලැබී තිබුණු මුළු සුදු සීනි ප්‍රමාණය සම්බන්ධයෙන් කි.ග්‍රෑ.15,000 ක ප්‍රමාණයකට අදාලව රු.18,450 ක ගාස්තුවක වෙනසක් සහ පැකට් 23,514 ක් හෝ කි.ග්‍රෑ.170,119 ක් වූ ඇසුරුම් ද්‍රව්‍ය අඩුමානයට අදාල ආදායම් අහිමිවීමේ අවදානම පිළිබඳව කළමනාකාරිත්වය මෙතෙක් කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබීම. |
| (එ) | 2013 - 2.2.3 (අ)iii | ශේෂ පිරික්සුම හා මූල්‍ය ප්‍රකාශන සැසඳීමේදී ගිණුම් ශේෂ 03 ක රු.299,798,933 ක් වූ වෙනසක් අනාවරණය වීම. |

## 6. පද්ධති හා පාලනයන්

විගණනයේදී නිරීක්ෂණය වූ අඩුපාඩු පිළිබඳව වරින් වර සංස්ථාවේ සභාපතිවරයා දැනුවත් කරන ලදී. පහත දැක්වෙන පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමුකළ යුතුවිය.

| පද්ධති හා පාලන ක්ෂේත්‍ර | නිරීක්ෂණ |
|---|---|
| (අ) ගිණුම්කරණය | (i) ලෙජර ගිණුම් සඳහා කේත අංක භාවිතා නොකිරීම.<br>(ii) ජ'නල් වවුචර සඳහා සංලක්ෂයන් නිවැරදිව භාවිතා නොකිරීම.<br>(iii) වවුචරයට අදාල උපකාරක ලියවිලි නිසි පරිදි වවුචර සමඟ අමුණා නොතිබීම. |
| (ආ) තොග පාලනය | වාර්ෂිකව භෞතික තොග සමීක්ෂණයන් සිදු නොකිරීම හා වර්තමාන තොග වටිනාකම හඳුනා නොගැනීම. |
| (ඇ) මෙහෙයුම් පාලනය | (i) හිඟහිටි බදුකුලී අයකර ගැනීමට ප්‍රමාණවත් පියවර නොගැනීම.<br>(ii) බදු දේපල පරිපාලනයේ පවතින දුර්වලතා හේතුවෙන් විධිමත්ව බදුකුලී ගිවිසුම් අත්සන් කර සංස්ථාව සතු බදු දේපල බදු දීමට හෝ කල්පසු වූ ගිවිසුම් අලුත් කිරීමට හෝ බදු කටයුත්ත අවසන් කර දේපල නැවත පවරා ගැනීමට හෝ අවධානය යොමුකර නොතිබීම.<br>(iii) වර්තමානයේ පවතින වෙළඳපල අගයට වඩා අඩු අගයකට සංස්ථාව සතු දේපල බදු දීම. |

(iv) බදු දේපලවල බදු කුලිය වර්තමාන වෙළඳපල රේටයන් අනුව සංශෝධනය කිරීමට සංස්ථාව කටයුතු කළද දේපල බදු ගත් ආයතනයන් ඒ සඳහා එකඟතාවයක් නොමැති අවස්ථා වලදී සංස්ථාව තමන්ගේ වර්තමාන බදු කුලිය සඳහා ආයතනයන් එකඟකර ගැනීම සඳහා ප්‍රමාණවත් සාකච්ඡා වට පවත්වා නොතිබීම.

(v) සිදුවන අඩුමාන, හා ඒ සඳහා වගකිවයුතු පුද්ගලයින් පිළිබඳව සොයා බැලීමේ කටයුතු සිදු නොවීම.

(vi) ප්‍රවාහන පහසුකම් සැපයීම වෙනුවෙන් ගිවිසුමක් අත්සන් කර නොතිබීම.

(vii) ඉන්වොයිස්පත් සාධාරණ කාලසීමාවක් තුළ ලබා නොදීම.

(viii) ලංකා සතොස සමාගමේ ගබඩාවලින් සතොස ලොරි රථ සඳහා භාණ්ඩ පැටවීමේදී ඒ සඳහා වගකිවයුතු නිලධාරියෙකුගේ අධීක්ෂණයක් නොමැති වීම.

(ix) ඉන්වොයිස්පත් ලංකා සතොස සමාගමට යැවීම සඳහා විශාල කාලපරාසයක් ගතවීම අවම කර ගැනීමට කටයුතු නොකිරීම හා සංස්ථාවට ලැබිය යුතු මුදල් යම් නිශ්චිත කාලපරිච්ඡේදයක් තුල ලබා ගැනීම සඳහා කටයුතු නොකිරීම.